# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
## පරිසර අමාත්‍යාංශය

### ඇබෑර්තු - නීතිඥවරයකු (තාවකාලික පදනම)

පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන 1992අංක 33දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මගින් ස්ථාපිත කරන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අදාලව පහත දැක්වෙන නීතිමය කටයුතු සම්බන්ධයෙන් රාජකාරී ඉටුකර ගැනීමට ඉහත සඳහන් තනතුරේ සේවය ලබා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඉටුකල යුතු ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.**

1. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අදාල බලපත්‍ර අවලංගු කිරීම, බලපත්‍ර අත්හිටුවීම හා බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත්වන අභියාචනා විභාග කිරීමට අදාල නීතිමය කටයුතු ඉටුකිරීම.
2. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අදාල පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සම්බන්ධ සංශෝධනයන් කිරීම හා පනතට අදාල රෙගුලාසි සකස් කිරීම සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශයේ නීති අංශයට හා කාර්යාංශයට අදාලව නීතිමය කටයුතු සඳහා සහය වීම
3. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අදාලව ජනාධිපති කාර්යය සාධක බලකායේ නිර්දේශ ක්‍රියාත්මක කිරීටම්දී අමාත්‍යාංශය හා කාර්යාංශයේ නීති අංශ වලට අවශ්‍ය සහය ලබාදීම.
4. ඛනිජ ආයෝජන ගිවිසුම් පරීක්ෂා කිරීම, ඒවාට අදාල ලේඛන පරීක්ෂා කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය හා කාර්යාංශයේ නීති අංශ වලට අවශ්‍ය සහය ලබාදීම.

**සුදුසුකම්**

- **ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වීම**

**පළපුරුද්ද**

- **රාජ්‍ය ආයතනවල නීතිමය කටයුතු පිළිබඳ පලපුරුද්ද සහිතව වසර 15ක නීතිඥවෘත්තියේ පලපුරුද්ද**

ඉහත කාර්යයන් ඉටුකිරීම සඳහා මාසිකව අයකරනු ලබන ගාස්තු ප්‍රමාණයන්ද සහිතව ඔබගේ ජීව දත්ත පත්‍රිකාවක් 2021.08.10 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමට කටයුතු කරන්න.

**අධ්‍යක්ෂ ජනරාල්**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය**
**නො.569, එපිටමුල්ල පාර,**
**පිටකෝට්ටේ.**

ඉංජිනේරු. ඩී. සජ්ජන ද සිල්වා
BSc(Eng).MSc(PM).C.Eng.MIE(SL).
අධ්‍යක්ෂ ජනරාල්
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
අංක 569, එපිටමුල්ල පාර,
පිටකෝට්ටේ.